දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 31/2016

PH/CF/CA/2/APACACC/2016,

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2016-11-28

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම මාණ්ඩලික නිළධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්.

<u>2016 වර්ෂය සඳහා ගිණුම් පියවීම</u>

2016 වර්ෂය සඳහා ගිණුම් පියවීම සම්බන්ධව රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 251/2016 හා 2016-10-17 දිනැති චක්‍රලේඛය හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 07/2016 හා 2016-11-18 දිනැති චක්‍රලේඛය සම්බන්ධවයි. මෙම චක්‍රලේඛ www.treasury.gov.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ලබාගත හැක. ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගිණුම් පියවීමේ කටයුතු පහත උපදෙස් පරිදි සිදු විය යුතු බව අවධාරණය කරණු ලැබේ.

**01. 2016 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන හා අත්මුදල් ලබා ගැනීම.**

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2016 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන, වැය විෂයන් කිහිපයකම මේ වන විට අවසන් වෙමින් පවතින බැවින් ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සියළුම බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ii. 2016 දෙසැම්බර් මාසය සඳහා ඔබ ආයතනයට ලබා දෙන ප්‍රතිපාදන සීමාව ඉක්මවා ( ඒ ඒ වැය විෂයන් වලට අදාලව) කිසිදු ගෙවීමක් නොකිරීමට ආයතන ප්‍රධානීන් තරයේ වග බලාගත යුතුය. යම් හෙයකින් දෙසැම්බර් මාසය සඳහා ලබා දෙන ප්‍රතිපාදන හෝ අත් මුදල් ඉතිරි වන්නේ නම් ඒ පිළිබඳව කඩිනමින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත විද්‍යුත් තැපැල් (commfinance@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් දැනුම් දීමට කටයුතු කල යුතුය.

iii. දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන හා අත් මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන නිරවුල් කල හැකි සියළුම බිල්පත් නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුවේ ගෙවීම් භාරව කටයුතු කරන සියළුම නිළධාරීන් වග බලා ගත යුතු අතර, ලබා දී ඇති සියළුම අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් නොදැරීමටත්, වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන ලෙස වියදම් දැරීමටත් කටයුතු කල යුතුය.

iv. 2016 වර්ෂයේ අවසන් කරන ලද සියළුම සැපයුම් හා සේවාවන් වලට අදාල ගෙවීම් වවුචර අදාල සැපයුම්කරුවන් මගින් කඩිනමින් ගෙන්වා ගැනීමට අදාල විෂය භාර නිලධාරීන් කටයුතු කල යුතුය. එම වවුචර ගෙවීම් අංශ වෙත නොපමාව ලබා දීමට අදාල අංශ ප්‍රධානීන් කටයුතු කල යුතු වේ. මේ පිළිබඳව අදාල සැපයුම්කරුවන්ට ලිඛිතව දැනුම් දීමටත් පියවර ගත යුතුය.

**02. 2016 මුදල් වර්ෂයට අදාලව මුදල් පොත් පියවීම.**

i. **2016-12-29** වන බ්‍රහස්පතින්දා දින වැලිකඩ, මැගසින්, කොළඹ රිමාණ්ඩ් යන බන්ධනාගාර හැර අනෙකුත් සියළුම බන්ධනාගාර ආයතනයන් විසින් එදින ප.ව **04.00**ට මුදල් පොත් පියවීමට කටයුතු කල යුතුවේ. එසේම ඉහත සඳහන් ආයතනයන් පමණක් **2016-12-30** දින ප.ව. **02.00** ට මුදල් පොත් පියවීමට කටයුතු කල යුතුවේ. එබැවින් ගිණුම් අංශ නිළධාරීන් මෙන්ම ගිණුම් පියවීමට බලයලත් නිළධාරීන් ගිණුම් පියවීම් අවසන් වන තෙක් ආයතනය තුල එදිනට රැඳී සිටීමට වග බලා ගත යුතුවේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව උප ආයතන රාශියකින් සමන්විත වන බැවින් හා ගිණුම් පියවීම ඉතා සංකීර්ණ වන බැවින් ද මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කල යුතුවේ.

ii. 2016 වර්ෂයේ සිට ඉදිරියට ශුන්‍ය පාද අයවැය ක්‍රමය (Zero Based Budgeting System) ක්‍රියාත්මක වන බැවින් සියළුම බන්ධනාගාර ආයතනවල 2016 දෙසැම්බර් 31 දිනට පෙර ගමන් වියදම්, ඉන්ධන අත්තිකාරම් හා සුළු අත්මුදල් ඇතුළු සියළුම අත්තිකාරම් සම්පූර්ණයෙන් පියවා ගැනීමට කටයුතු කල යුතුය. දෙසැම්බර් මස අවසන් සති දෙක තුල අත්‍යාවශ්‍ය කරුණකට හැර අග්‍රිම අත්තිකාරම් ලබා නොදීමට ගෙවීම් බලධාරීන් වගබලා ගත යුතුය.

iii. <u>2016 වර්ෂය සඳහා මුදල්පොත් පියවනු ලබන සියළුම බන්ධනාගාර ආයතනයන් මුදල් පොත් පියවන දිනට මුදල් පොතේ ඉතිරි ශේෂයේ වටිනාකම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ බොරැල්ල ලංකා බැංකු ශාඛාවේ ගිණුම් අංක 7041491 ට චෙක්පතක් ලියා මුදල් පොත ශුන්‍ය කළ යුතුය. 2016-12-29 දින මුදල් පොත් පියවන ආයතන 30 වන දින පෙ.ව. 10.00 ට පෙර ඉහත ගිණුමට, අදාල චෙක්පත බැර කල යුතු අතර 2016-12-30 මුදල් පොත් පියවන ආයතන</u>

ප.ව 03.00 ට පෙර අදාල චෙක්පත ගිණුමට බැර කල යුතුවේ. සියළුම ආයතන විසින් එම චෙක්පතේ ඡායා පිටපතක් හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ නිල බැංකු ගිණුමට(7041491) චෙක්පත බැර කල බවට තහවුරු කෙරෙන තැම්පතු පතෙහි (Cheque Deposit Slip) ඡායා පිටපතක්, ආවරණ ලිපිය සමග විද්‍යුත් තැපැල (commfinance@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එදිනම එවීමට කටයුතු කල යුතුය. මුදල් පොතේ ශේෂයක් නොමැති නම් ඒ පිළිබඳව ද, ලිඛිතව දැනුම් දීමට ඉහත පරිදි කටයුතු කල යුතුය. මේ සම්බන්ධයෙන් ඒ ඒ ආයතනයන්හි අධිකාරීන් / සහකාර අධිකාරීන් පෞද්ගලිකවම තම අවධානය යොමු කල යුතු බව අවධාරණය කෙරේ.

iv. බන්ධනාගාර ආයතන වල ගිණුම් පියවීම් සම්බන්ධව බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛනය ඇමුණුම් 01 හි දක්වා ඇත. අදාල නිලධාරීන් ඒ ඒ ආයතන වල මුදල් පොත වැසීමේ වගකීම දැරිය යුතුය. 2016 වර්ෂය වෙනුවෙන් මුදල් පොත් වැසීමෙන් පසු කිසිදු ගෙවීමක් මුදල් පොතේ සටහන් කල නොහැකි වන පරිදි එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ තම නම, තනතුර, අත්සන, දිනය හා වේලාව සටහන් කර 2016 වර්ෂයේ මුදල් පොත නියමිත පරිදි වැසූ බවට සටහන් තැබිය යුතුය.

v. 2017 වර්ෂය සඳහා අවශ්‍ය අත් මුදල් බන්ධනාගාර මූලස්ථානය මගින් ලබා දෙන බැවින් කිසිදු අග්‍රිම ශේෂයක් බන්ධනාගාර ආයතන විසින් රඳවා තබා ගැනීමට කටයුතු නොකල යුතු බව අවධාරණය කරමි.

**03.** මාසික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

i. 2016 දෙසැම්බර් 27 වන දින වන විට සිදුකර ඇති සියළු ගෙවීම් ගිණුම්ගත කොට කෙටුම්පත් ගිණුම් සාරාංශයක් මේ සමග ඇති ඇමුණුම් අංක 02 හි ඇති ආකෘතිය ප්‍රකාරව එවීමට කටයුතු කල යුතුවේ.

ii. 2016 දෙසැම්බර් මස ගිණුම් සාරාංශය 2017-01-04- වන දිනට පෙර ලබා දිය යුතුය. පලමු වන ගිණුම් සාරාංශයේ යම්කිසි ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරීම හෝ හරස් සටහන් මගින් කරනු ලබන ගෙවීමක් ගිණුම්ගත කිරීමට ඇත්නම් ඒ සඳහා පරිපූරක ගිණුම් සාරාංශයක් ඉදිරිපත් කල හැක. පරිපූරක ගිණුම් සාරාංශය 2017-01-10 වන දිනට පෙර ලබා දිය යුතුය.

iii. ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව යම් පැහැදිලි කරගැනීමක් වේනොත් දුරකථන අංක 011 4677116/ 011 2696536 මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) අමතන මෙන් කාරුණිකව දන්වමි. කාර්මික හා කෘෂිකාර්මික ගිණුමට අදාලව ගිණුම් හා මුදල් පොත පියවීම සම්බන්ධව වෙනමම චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව වැඩි දුරටත් දන්වමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත:- 01. විගණකාධිපති - දැ.ගැ.පි

02. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන) - අ.ක.ස

( ඇමුණුම 01 )

## 2016 වර්ෂයේ ශිණුම් පියවීම සඳහා බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

| # | # | නිලධාරියාගේ නම | තනතුරු නාමය | ආයතනය |
|---|---|---|---|---|
| 1 | BC | එච්.සී.ඩබ්. කාරියවසම් | බන්ධනාගාර කොමසාරිස් මුදල් | මූලස්ථානය |
| 2 | B1 | ටී.ආර්.ඩබ්.එම්.ඒ. ඒකනායක | බන්ධනාගාර අධිකාරී | වැලිකඩ |
| 3 | B2 | කේ.ඒ.එස්. කොඩිතුවක්කු | බන්ධනාගාර අධිකාරී | කොළඹ රිමාන්ඩ් |
| 4 | B3 | කේ.කේ.එස්.යූ. රන්ජන් | බන්ධනාගාර අධිකාරී | මැගසින් |
| 5 | B4 | වී.අයි. උඩුවර | බන්ධනාගාර අධිකාරී | මහර |
| 6 | B5 | එම්.එන්. ලාහිර් | සහකාර බන්ධනාගාර අධිකාරී | ප.වි.පු.ම |
| 7 | B6 | ඩී.එම්.එස්.පී. දසනායක | සහකාර බන්ධනාගාර අධිකාරී | මීගමුව |
| 8 | B7 | එච්.ඒ.එම්.එස්.බී. සේනානායක | බන්ධනාගාර අධිකාරී | මහනුවර |
| 9 | B8 | පී.එම්.පී. ලියනගේ | බන්ධනාගාර අධිකාරී | පල්ලේකැලේ |
| 10 | B9 | එච්.ඒ.සී. පෙරේරා | සහකාර බන්ධනාගාර අධිකාරී | යාපනය |
| 11 | B10 | එල්.ජේ.එම්.කේ. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී | අනුරාධපුරය |
| 12 | B11 | එස්.ආර්. ගලප්පත්ති | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | බදුල්ල |
| 13 | B12 | ආර්.එම්.එස්. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී | තල්දෙන |
| 14 | B13 | කේ.එම්.යූ.එච්. අක්බාර් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මඩකලපුව |
| 15 | B14 | ජේ.සී. වීරසිංහ | සහකාර බන්ධනාගාර අධිකාරී | ගාල්ල |
| 16 | B15 | කේ.ඩබ්.එස්. ධම්මික | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මාතර |
| 17 | B16 | බී.ඩී.එම්.පී.බී. දිසානායක | සහකාර බන්ධනාගාර අධිකාරී | වීරවිල |
| 18 | B17 | ඩබ්.ඒ.ඩී.සී. කරුණාසේකර | සහකාර බන්ධනාගාර අධිකාරී | තංගල්ල |
| 19 | B19 | එස්.ආර්. ජයවීර ද සිල්වා | සහකාර බන්ධනාගාර අධිකාරී | කුරුවිට |
| 20 | B20 | ඩී.ආර්.ඩී. දසනායක | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | දුම්බර |
| 21 | B21 | ආර්.පී.එච්. කුමාර | සහකාර බන්ධනාගාර අධිකාරී | ත්‍රිකුණාමලය |
| 22 | B22 | එස්.කේ. පල්ලේතැන්න | සහකාර බන්ධනාගාර අධිකාරී | කළුතර |
| 23 | B23 | ආර්.ඩබ්.ඩබ්.යූ.ඩී.ඒ. සම්පායෝ | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | කෑගල්ල |
| 24 | B24 | සී. ලියනගේ | සහකාර බන්ධනාගාර අධිකාරී | බූස්ස |
| 25 | B25 | එස්.වී.එච්. ප්‍රියංකර | සහකාර බන්ධනාගාර අධිකාරී | වටරැක |
| 26 | B26 | ඒ.එම්.එම්. අලහකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී | වාරියපොළ |
| 27 | B27 | ඩී.ඒ.එම්.එන්. ශාන්ත | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මොණරාගල |
| 28 | B28 | පී.එච්.එම්.කේ.එම්. අබේරත්න | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | පොළොන්නරුව |
| 29 | B29 | එම්.එච්.ආර්. අජිත් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | අඟුණුකොළපැලැස්ස |
| 30 | B30 | ඩබ්.ජී.එන්. ප්‍රනාන්දු | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වව්නියාව |

* යම් හෙයකින් ඉහත බලය පැවරූ නිලධාරියෙකු ස්ථාන මාරු නියෝගයක් මත බන්ධනාගාර ආයතනය මාරු වන්නේනම් ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු කල යුතුය.

## Expenditure Statement up to month of December 2016

Name of Institute :

| Object Code | Description | Allocation Relese up to date | Expenditure of 1st Dec to 26th Dec | Allocation Balance | Remarks |
|---|---|---|---|---|---|
| | **Recurrent Expenditure** | | | | |
| | ***Personnel Emoluments*** | | | | |
| 1001 | Salaries & Wages | | | | |
| 1002 | Overtime | | | | |
| 1003 | Other Allowances | | | | |
| | ***Traveling*** | | | | |
| 1101 | Domestic | | | | |
| 1102 | Foreign | | | | |
| | ***Supplies*** | | | | |
| 1201 | Stationeries & Office Requ. | | | | |
| 1202-1 | Fuel & Lubricant | | | | |
| 1202-2 | Firewoods | | | | |
| 1202-3 | Ferness Oil | | | | |
| 1203-1 | Diet | | | | |
| 1203-2 | Uniform | | | | |
| 1204 | Medical Supplies | | | | |
| 1205 | Others | | | | |
| | ***Maintenance Expenditure*** | | | | |
| 1301 | Vehicle | | | | |
| 1302 | Plant, Machinery & Equipment | | | | |
| 1303 | Buildings | | | | |
| | ***Service*** | | | | |
| 1401 | Transport | | | | |
| 1402-1 | Postal | | | | |
| 1402-2 | Telecomunication | | | | |
| 1403-1 | Water | | | | |
| 1403-2 | Electricity | | | | |
| 1404 | Rates & Tax to Local Authority | | | | |
| 1405 | Others | | | | |
| | ***Transfer*** | | | | |
| 1506 | Property Loan Interest | | | | |
| 1508 | Others | | | | |
| | **Capital Expenditure** | | | | |
| | ***Rehabilitation & Improvement*** | | | | |
| 2001 | Building & Structure | | | | |
| 2002 | Plant & Machinery | | | | |
| 2003 | Vehicle | | | | |
| | ***Furniture & Office Equipment*** | | | | |
| 2101 | Vehicle | | | | |
| 2102-1 | Furniture | | | | |
| 2102-2 | Information Technology Instruments | | | | |
| 2102-3 | Security Equipments | | | | |
| 2102-4 | Traning & Media Equipments | | | | |
| | ***Plant & Machinery*** | | | | |
| 2103 | Others | | | | |
| 2103 | Plant & Machinery Equipments | | | | |
| | ***Building & Structure*** | | | | |
| 2104-1 | wariyapola Nurd Building | | | | |
| 2104-2 | Other Constructions | | | | |
| | **Capacity Building** | | | | |
| 2401-1 | staff Training Domestic | | | | |
| 2401-2 | staff Training Foreign | | | | |
| | ***Other Capital Expenditure*** | | | | |
| 1-2502 | Co : Of Pallekele Prison Complex | | | | |
| 3-2502 | Co : Of Jaffna Prison Complex | | | | |
| 5-2502 | Co : Of Tangalle | | | | |
| 7-2502 | Co : Of Office Building at H Q | | | | |
| 8-2502 | Prisoners Rehabilitation Programme | | | | |
| 9-2502 | Prisons Training Center Building | | | | |
| | ***Total Expenditure*** | | | | |

| | |
|---|---|
| **Cash book Balance ad at 26/12/2016** | |